# ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (NBRO)

## ආරක්ෂක අමාත්‍යාංශය

# ඇබෑර්තු

## ස්ථාවර කිරීමේ ක්‍රමවේදය මගින් නායයෑමේ අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය (RLVMMP)

### අරමුදල් සැපයීම ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව විසිනි (AIIB)

ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) විසින් අරමුදල් සපයනු ලබන, ස්ථාවර කිරීමේ ක්‍රමවේදය මගින් නායයෑමේ අවදානම අවම කිරීමේ ව්‍යාපෘතියෙහි (RLVMMP) ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙහි (PMU) පවත්නා පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ. මෙම ව්‍යාපෘතියෙහි ක්‍රියාත්මක කිරීමේ නියෝජ්‍යායතනය වනුයේ ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවත්නා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයට (NBRO) මෙම ව්‍යාපෘතිය යටතේ නාය යාමේ අවදානම අවම කිරීමේ කාර්යයන්, බදුල්ල, මහනුවර, මාතලේ, කෑගල්ල, රත්නපුර, නුවරඑළිය, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට හා කුරුණෑගල යන නගරවල ස්ථාන 147 ක් තුළ සිදුකිරීමට නියමිත අතර, මෙම ව්‍යාපෘතිය යටතේ උඩරට දුම්රිය මාර්ගයේ අස්ථායී ස්ථාන වැඩිදියුණු කිරීමට අපේක්ෂිතය. පියවර 1 යටතේ ඉතා අවදානම් ස්ථාන 25 ක් අවම කිරීම් / නිවැරදි කිරීම් සිදුකිරීමට නියමිත අතර, ඉතිරි ස්ථාන පියවර 2 යටතේ අවම කිරීම්/ නිවැරදි කිරීම් සිදුකරනු ඇත.

## ව්‍යාපෘති ගණකාධිකාරී (තනතුරු 01 - PS4 - වර්ගීකරණය A)

**තනතුර පිළිබඳ විස්තර කෙටියෙන් :**

මූල්‍ය රෙගුලාසි හා අනෙකුත් ව්‍යවස්ථාපිත අවශ්‍යතා ප්‍රකාරව සියලුම ගෙවීම් හා වාර්තාකරණයන් නිසි අයුරු සිදුවීම සහතික කරනු පිණිස ව්‍යාපෘතියෙහි සම්පූර්ණ මූල්‍ය වාර්තාකරණය සඳහා සහකාර අධ්‍යක්ෂ වෙත සහායවීම.

**අවම සුදුසුකම් හා පළපුරුද්ද**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගණකාධිකාරී හා මූල්‍ය ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කොට තිබීම **හෝ**
   විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ගණකාධිකරණ හා මූල්‍ය ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියට සමාන බවට පිළිගත් වෙනත් සුදුසුකමක් **හෝ**
   ගණකාධිකරණ හා මූල්‍ය ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය හෝ සමාන වෘත්තීය සුදුසුකම් සමග
   අදාළ ක්ෂේත්‍රයේ සුදුසුකම් ලැබීමෙන් පසු, අවම වශයෙන් වසර 08 ක පළපුරුද්ද **හෝ**
2) රජයේ දිපවයාප්ත සේවයේ III/ II පන්තියේ හෝ ඉහළ නිලධාරියෙකු වීම හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තනතුරක් සමග, අදාළ ක්ෂේත්‍රයේ සුදුසුකම් ලැබීමෙන් පසු අවම වශයෙන් වසර 08 ක පළපුරුද්ද.

## ප්‍රමාණ සමීක්ෂක (තනතුරු 02 - PS6 තලය)

**තනතුර පිළිබඳ විස්තර කෙටියෙන් :**

මෙම ව්‍යාපෘතිය යටතේ බෑවුම් නිවැරදි කිරීම සඳහා අවශ්‍ය පූර්ව කොන්ත්‍රාත් හා පශ්චාත් කොන්ත්‍රාත් ප්‍රමාණ සමීක්ෂණ කාර්ය කළමනාකරණය හා සම්බන්ධීකරණයට සහාය වීම සඳහා ප්‍රසම්පාදන විශේෂඥවරයා හට හා ප්‍රසම්පාදන ඉංජිනේරුවරුන්හට සහයෝගය ලබාදීමේ වගකීම දරයි.

**අවම සුදුසුකම් හා පළපුරුද්ද :**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රමාණ සමීක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කොට තිබීම **හෝ**
   විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින්, ප්‍රමාණ සමීක්ෂණ ප්‍රථම උපාධියට සමාන බවට පිළිගත් වෙනත් සුදුසුකමක් **හෝ**
   ප්‍රමාණ සමීක්ෂණ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය හෝ සමාන වෘත්තීය සුදුසුකම් **හෝ**
   තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ ජාතික වෘත්තීය සුදුසුකම් 7 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම **සහ**
   ප්‍රමාණ සමීක්ෂණ ක්ෂේත්‍රයේ සුදුසුකම් ලැබීමෙන් පසු අවම වශයෙන් වසර 03 ක පළපුරුද්ද **හෝ**
2. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ ජාතික වෘත්තීය සුදුසුකම් 6 තලයට නොඅඩු ප්‍රමාණ සමීක්ෂණ ක්ෂේත්‍රයේ තනතුරකට අදාළව ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම **සහ**
   ප්‍රමාණ සමීක්ෂණ ක්ෂේත්‍රයේ සුදුසුකම් ලැබීමෙන් පසු, අවම වශයෙන් වසර 08 ක පළපුරුද්ද **හෝ**
3. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ හා වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ ජාතික වෘත්තීය සුදුසුකම් 5 තලයට නොඅඩු ප්‍රමාණ සමීක්ෂණ ක්ෂේත්‍රයේ තනතුරකට අදාළව ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම **සහ**
   ප්‍රමාණ සමීක්ෂණ ක්ෂේත්‍රයේ සුදුසුකම් ලැබීමෙන් පසු අවම වශයෙන් වසර 13 ක පළපුරුද්ද.

**පොදු කොන්දේසි**

බඳවා ගැනීම්, මූලිකව එක් වසරකට කොන්ත්‍රාත් පදනමින් සිදුකරනු ලබන අතර, සාර්ථක කාර්යසාධනය මත ඉන්පසු වාර්ෂිකව අලුත් කළ හැක. රාජ්‍ය සේවයේ / ව්‍යවස්ථාපිත මණ්ඩලවල/ සංස්ථාවල හෝ වෙනත් රජයේ ආයතනවල අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතු අතර, ඔහු විසින් මෙම අයදුම්කරු නව තනතුරට තෝරා පත් කරගත හොත්, දැනට දරනු ලබන තනතුරින් නිදහස් කළ හැකිද යන කරුණ සඳහන් කළ යුතුය.

සේවකයා විසින්, සේවක අර්ථසාධක අරමුදලට තම වැටුපෙන් 8%ක දායකත්වයක් ලබාදිය යුතු අතර, සේව්‍යයා විසින් ඒ සඳහා 12%ක දායකත්වයක් දරනු ලබයි. එයට අමතරව සේව්‍යයා විසින් 3% ක දායකත්වයක් සේවක භාර අරමුදලට ලබාදෙනු ඇත.

**වැටුප :**

අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය හා අනෙකුත් අදාළ කළමනාකරණ සේවා චක්‍රලේඛයන්හි විධිවිධාන ප්‍රකාරව වැටුප් ගෙවනු ලැබේ.

**අයදුම්පත් ඉදිරිපත් කිරීම**

අයදුම්පත් මෙම දැන්වීම පළවී දින 10 ක් ඇතුළත සම්පූර්ණ ජීවදත්ත ඇතුළත්ව, නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් හා ඇමතුම් අංක සමග අදාළ සහතිකවල පිටපත් සහිතව ලැබීමට සැලැස්විය යුතුය.

අයදුම්පත් බහාලූ අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ, අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතු අතර, අයදුම්පත් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය.

(යථා පරිදි සම්පූර්ණ නොකළ, අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද නොමැතිව හා සහතිකවල පිටපත් නොමැති ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ)

**ව්‍යාපෘති අධ්‍යක්ෂ, ස්ථාවර කිරීමේ ක්‍රමවේදය මගින් නායයෑමේ අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය,**
**ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය, 99/1, ජාවත්ත පාර, කොළඹ 05.**

Source: Dinamina, Daily News (2020.02.12)